**මාධ්‍ය නිවේදනය**

2017 අප්‍රේල් 24, කොළඹ

Nestlé
Good Food, Good Life

## නෙස්ලේ ලංකා සමාගම අවුරුදු සමරයි

නෙස්ලේ ලංකා සමාගම සිය ප්‍රධාන කාර්යාලයේදී, එම සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මියගේ සහ එම කාර්යමණ්ඩලයේ සහභාගීත්වයෙන් අළුත් අවුරුදු උත්සවය සමරණ ලදී. අවුරුදු උත්සවයේ කටයුතු හා ක්‍රීඩා ඉසව්, කිරි ඉතිරවීම සහ පොල් තෙල් පහන දැල්වීමත් සමග ආරම්භ කළ අතර සම්ප්‍රදායික අවුරුදු උදෑසන කෑම වේලක්ද ලබා දෙන ලදි.

ඉන් පසුව සම්ප්‍රදායිකව ළිඳ සමග සහ ගැමි ගෙදරදී 'ගනු දෙනු' චාරිත්‍රය සිදුකරන ලදි. අවුරුදු ක්‍රීඩා සඳහා කාර්යමණ්ඩලය මහත් උද්යෝගයෙන් සහභාගිවූ අතර 'කණා මුට්ටි', 'කොට්ට පොර', පොල් ගෑමේ තරඟය, දෙහි ගෙඩිය හැන්ද මත තබාගෙන යාම, නෙස්ටමෝල්ට් පානය කිරීමේ තරඟය සහ 'ඔන්චිලි පැදීම' වැනි තරඟ ඉසව් එහිදී පැවැත්විණි.

---

**සංස්කාරක වෙත :**

නෙස්ලේ, ලොව විශාලතම ආහාර සහ රසවත් පානීය නිෂ්පාදන සමාගමයි. ලොව පුරා රටවල් 189ක නෙස්ලේ සමාගම සිය ව්‍යාපාර මෙහෙයුම් පවත්වාගෙන යයි. ලොව පුරා සේවයෙහි යෙදී සිටින නෙස්ලේ සමාගමේ සේවක පිරිස 328,000 ක් පමණ වන අතර පාරිභෝගික ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සෞඛ්‍යසම්පන්න අනාගතයක් නිර්මාණය කිරීම වෙනුවෙන් නෙස්ලේ සමාගම සතු දැක්ම යථාර්තයක් කරගැනීම සඳහා ඔවුහු කැපවී සිටිති. ලොව පුරා ජනතාව මෙන්ම සුරතල් සතුන් වෙනුවෙන් නෙස්ලේ සමාගම පුළුල් පරාසයක නිෂ්පාදන සහ සේවා රාශියක් ලබා දීම සිදුකරයි. නෙස්කැෆේ හෝ මැගී වැනි ජාත්‍යන්තර වශයෙන් ඉහළ පාරිභෝගික ආකර්ෂණයක් හිමි සන්නාමයන්හි මෙන්ම දේශීය පාරිභෝගික හදවත් වෙත ඉතාමත් සමීප වූ නෙස්ටමෝල්ට් සන්නාමය වැනි නිපැයුම් තෙක් පුළුල් පරාසයක පැතිරුණු 2000කට අධික සන්නාමයන් ප්‍රමාණයක් නෙස්ලේ සමාගම සතුය. පෝෂණය, සෞඛ්‍ය සහ යහගුණය නෙස්ලේ සමාගමේ කාර්යසාධනය ඉදිරියට ගෙන යාමේ ක්‍රමෝපායික පදනම වේ. නෙස්ලේ සමාගමේ ආරම්භක මූලස්ථානය ස්විට්සර්ලන්තයේ Vevey නගරය වන අතර වර්ෂ 150කට අධික ඉතිහාසයක් හිමි සමාගමකි.

නෙස්ලේ ලංකා සමාගම 1906 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ සිය ව්‍යාපාරික මෙහෙයුම් සිදු කර ඇත. දේශීය බහු ජාතික සමාගමක් ලෙස, එහි නිපැයුම් වැඩි වශයෙන් දේශීය අමුද්‍රව්‍ය යොදාගනිමින් දේශීයව නිපදවනු ලබයි. අද, නෙස්ලේ ලංකා සමාගම සැමගේ ආදරය දිනාගත් වෙළඳ නාම රාශියකින් සමන්විත වන අතර සමාගම සතු පෝෂණය පිළිබඳ ගෝලීය විශේෂඥ දැනුම, සමීක්ෂණ සහ සංවර්ධන (R&D) ජාලය සහ දැඩි තත්ත්ව පාලන ප්‍රමිතීන් ඒ සඳහා විශාල වශයෙන් දායක වේ. කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් අතර වෙළෙඳපොල ප්‍රාග්ධනීකරණයෙන් පළමු ස්ථාන හතරට අයත්ව සිටින නෙස්ලේ ලංකා සමාගම 25,000කට අධික ගොවීන් පිරිසකගේ ජීවනෝපාය පවත්වාගෙන යාම සඳහා සුවිසල් දායකත්වයක් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ අංක එකෙහි ආහාර සහ රසවත් පානීය නිපැයුම් සමාගම වශයෙන් නෙස්ලේ ලංකා සමාගම ඇගයීමටද ලක්වී ඇත (LMD වඩාත් ගෞරවනීය ව්‍යාපාරික ආයතන වර්ගීකරණය 2016).

වැඩි විස්තර සඳහා www.nestle.lk වෙත පිවිසෙන්න.